# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1802/10 - 2013 මාර්තු මස 19 වැනි අඟහරුවාදා - 2013.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15(1) වගන්තිය යටතේ නියෝගය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙම නියමයෙන් මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති, යාපනය මහ නගර සභාවට අයත් ඉඩම් කොටස අද දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 03,
අංක 15/5, බාලදක්ෂ මාවත,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යාපනය මහ නගර සභා සීමාව තුළ, කොටුව ගමේ පිහිටියා වූ ද බලයලත් මිනින්දෝරු කේ. කනගසබෙයි මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 401 හා 2010.08.24 වැනි දිනැති සැලැස්මේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති පර්. 31.46ක් විශාල වූ නුවර පාරේ පිහිටි තානායම් භූමිය.

ඉඩමේ මායිම් පහත පරිදි වේ :

*උතුරට* : නුවර ප්‍රධාන මාර්ගය ;
*නැගෙනහිරට* : පැරණි අත්තිවාරම ;
*දකුණට* : මාර්ගය සඳහා වෙන් කළ ඉඩම ;
*බටහිරට* : මුහුදු මාර්ගය.

04-91/1


1A - G 017447 — 340 (2013/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15(1) වගන්තිය යටතේ නියෝගය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙම නියමයෙන් මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති, යාපනය මහ නගර සභාවට අයත් ඉඩම් කොටස අද දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 03,
අංක 15/5, බාලදක්ෂ මාවත,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යාපනය මහ නගර සභා සීමාව තුළ, පෂායියූර් ගමේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු හා තලම්තිකරු කේ. කනගසබෙයි මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 4931/12 හා 2012.02.11 වැනි දිනැති සැලැස්මේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.5774 (අ. 1, රූ. 1, පර්. 28.23) ක් විශාල වූ වෙරළ පාරේ පිහිටි කොන්ක්‍රීට් අංගනය නමැති ඉඩම.

ඉඩමේ මායිම් පහත පරිදි වේ :

*උතුරට* : අන්තෝනිඅප්පු, අන්තෝනිපාලම්මා සහ මතියස් අන්තෝනිපිල්ලායි පදිංචි ඉඩම් ;
*නැගෙනහිරට* : අන්පු පච්චයිකිලි, ඇන්තනි කාමීලා පදිංචි ඉඩම් සහ පසයියූර් මාතෘ නිවාසය පිහිටි ඉඩම ;
*දකුණට* : වෙරළ පාර ;
*බටහිරට* : ඒ. ස්ටැනිස්ලස් සහ කොටස් හිමියෝ.

04-91/2

---

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15(1) වගන්තිය යටතේ නියමය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම බේරුවල ප්‍රාදේශීය සභාවට අයත් වූ මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම, නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීම පිණිස 1998.01.01 වැනි දින අංක 1008/18 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මෙයින් අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 03,
අංක 15/5, බාලදක්ෂ මාවත,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය සභාවේ, පයාගල උප කොට්ඨාසය තුළ පිහිටියාවූ ද, බලයලත් මිනින්දෝරු ඊ. ටී. ගුණවර්ධන මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 518 හා 1986.02.15 වැනි දිනැති පිඹුරේ කැබලි අංක 3 වශයෙන් දක්වා ඇත්තාවූ ද, උතුරට කැබලි අංක 1, 2 සහ ඒ. ඩබ්. වීරකෝන්ට අයත්ව ඇති ගෙදරවත්ත ද, නැගෙනහිරට කැබලි අංක 2 සහ ගාලු පාර ද, දකුණට කැබලි අංක 4, 5 සහ 6 ද, බස්නාහිරට දුම්රිය මාර්ග රක්ෂිතය ද මායිම් වන්නාවූ ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් දොලහයි දශම බිංදුවයි හයක් (අ. 1, රූ. 2, පර්. 12.06) ක් වන සම්පූර්ණ ඉඩම.

04-91/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.